SJSW 2025 5(1) : 91-105

Student Journal of Social Work (SJSW)
Volume 05– Issue 01

07

# ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ රැකියා තත්ත්වය ගෘහස්ථ ජීවිතයට සිදු කරන බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

# THE IMPACT OF EMPLOYMENT CONDITIONS OF WOMEN EMPLOYED IN THE GARMENT INDUSTRY ON THEIR DOMESTIC LIFE

**H.M.N.D. Herath**
School of Social Work, National Institute of Social Development, Seeduwa, Sri Lanka
Email: nimashadeshani1999@gmail.com

## ABSTRACT

Among Sri Lanka's export-oriented industries, the garment industry occupies a prominent position. It plays a vital role in the national economy both as a major source of foreign exchange earnings and as a significant generator of employment. The garment industry is particularly important as a key source of employment for women. From its inception, women have constituted the majority of the workforce in this sector, accounting for approximately 80 percent of total employment. Although women represent the dominant segment of employees in the garment industry, they are confronted with a wide range of challenges.

Against this backdrop, the main objective of this research is to examine the impact of the employment conditions of women engaged in the garment industry on their domestic lives. Specifically, the study seeks to explore how work-related pressures experienced by women in the garment industry influence their domestic life, to identify the attitudes of family members towards their employment, and to determine possible forms of social intervention to address the effects of women's employment conditions on household life. Accordingly, the research problem focuses on identifying the challenges faced by women employed in the garment industry in balancing occupational responsibilities with the maintenance of domestic life. For the purpose of the study, a non-probability purposive sampling technique was employed, and twenty women employed in garment factories in the Katunayake Free Trade Zone were selected as the study sample. Data were collected through in-depth interviews and case studies. Analysis of the collected data reveals that

the employment conditions of women in the garment industry have a substantial impact on their domestic lives. The inability to achieve a proper balance between work and household responsibilities has resulted in numerous adverse outcomes, including physical and mental health problems, domestic violence, family conflicts, anxiety, child-related issues, weakened social relationships, and heightened psychological stress.

Overall, the findings of the study indicate that women employed in the garment industry face a wide range of challenges in maintaining their domestic lives. In light of these challenges, the study highlights the necessity of professional interventions to promote positive social recognition and to support women in achieving a balanced and sustainable domestic life.

**KEYWORDS :** Garment industry; women employed in the garment industry; domestic life.

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත අතරින් ඇඟලුම් කර්මාන්තය සුවිශේෂී වේ. ඇඟලුම් කර්මාන්තය විදෙස් ආදායම් මාර්ගයක් වශයෙන් මෙන්ම රැකියා උත්පාදනය අතිනුත් ආර්ථිකය තුළ ඉටුකරන කාර්ය අතිමහත්ය. මෙම ක්ෂේත්‍රය කාන්තාවන්ට රැකියාව සපයන වැදගත් මූලාශ්‍රයක් වේ. ආරම්භයේ සිටම ඇඟලුම් කර්මාන්තයේ වැඩි වශයෙන් (80%) සේවා නියුක්තව සිටිනුයේ කාන්තාවන්ය. ඇඟලුම් කර්මාන්තයේ සේවා නියුක්තව සිටිනුයේ බහුතරයක් කාන්තාවන් උවත් ඔවුන් විශාල වශයෙන් විවිධ වූ අභියෝග සඳහා මුහුණ දේ. එම හේතුවෙන් ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ රැකියා තත්ත්වය ගෘහස්ත ජීවිතයට සිදු කරන බලපෑම් පිළිබඳ අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. ඒ හරහා ඇඟලුම් කර්මාන්තයනයට කාන්තාවන්ගේ රැකියාව තුළ ඇති පීඩනය ගෘහස්ත ජීවිතයට බලපාන ආකාරය, ගෘහස්ථ සාමාජිකයන් මෙම කාන්තාවන්ගේ රැකියාව පිළිබඳ දක්වන ආකල්ප හඳුනා ගැනීම මෙන්ම මෙම කාන්තාවන්ගේ රැකියා තත්ත්වය ගෘහස්ථ ජීවිතයට ඇති කරන බලපෑම සඳහා සමාජයට මැදිහත් වීමේ ක්‍රම හඳුනා ගැනීම අරමුණු කර ගන්නා අතර පර්යේෂණ ගැටලුව ලෙස ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ට රැකියා වගකීම් සමග ගෘහස්ථ ජීවිතය පවත්වාගෙන යාමේදී මුහුණ දෙන ගැටලු මොනවාද යන්න ආවරණය කරනු ලබයි. අධ්‍යයනය සඳහා සසම්භාවී නොවන අරමුණු සහගත නියැදියට අනුකූලව කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන් විසි දෙනෙකු තෝරාගන්නා ලදී. ඒ අනුසාරයෙන් සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන උපයෝගී කොට දත්ත එක් රැස් කිරීම සිදුකරන ලදී. ලබාගත් දත්ත විශ්ලේෂණයට අනුව ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන්ගේ රැකියා තත්ත්වය ගෘහස්ථ ජීවිතයට විශාල බලපෑමක් ඇති බව අධ්‍යන දත්ත අනාවරණය කරයි. මෙම ද්විත්වය නිසියාකාරව සමපාත නොකිරීම නිසාවෙන් ශාරීරික හා මානසික රෝග, ගෘහස්ථ හිංසනය, පවුල් ගැටලු ,කනස්සල්ල, දරුවන්ගේ ගැටලු, සමාජ සබඳතා දුරස්ථවීම, මානසික ආතතිය, වැනි කරුණුවලට මුහුණ දීමට මෙම කාන්තාවන්ට සිදු වී ඇත. මෙම පර්යේෂණය හරහා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ට ගෘහස්ථ ජීවිතය පවත්වාගෙන යාමේදී විශාල

අභියෝග රාශියකට මුහුණ දීමට සිදුවන බවත් එම අභියෝග හමුවේ යහපත් සමාජ පිළිගැනීමක් නිර්මාණය කිරීම හා ගෘහස්ථ ජීවිතය සමබරව පවත්වාගෙන යෑමට දක්ෂ වෘත්තිකයන්ගේ මැදිහත්වීම අත්‍යවශ්‍ය බව අනාවරණය විය.

**මූඛ්‍ය පද:** ඇඟලුම් කර්මාන්තය, ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන්,ගෘහස්ථ ජීවිතය

## හැඳින්වීම

ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා නියුක්ත කාන්තාවන්ට මුහුණ දෙන ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ අඩු පහසුකම් නවාතැන් තුළින් පැන නගින ලිංගික අපහරණයන් සහ අපයෝජනයන් හේතු වී ඇත. සේවා ස්ථාන පදිංචි ස්ථානයට ආසන්නයේ පැවතීම මෙන්ම ඒවාට පහසුවෙන් ළඟා වීමට ඇති හැකියාවත් කාන්තාවන් රැකියාවක් තෝරා ගැනීමේදී සලකා බලන වැදගත් කරුණු වේ. විවාහක සහ දරුවන් සිටින කාන්තාවන් සම්බන්ධයෙන් මෙම කාරණය ඉතා වැදගත් වේ. මෙවැනි කාන්තාවෝ ඔවුන් වෙත පැවරී ඇති පවුල් වගකීම් නිසා වෙනත් දුර බැහැර නාගරික ප්‍රදේශවල නැවතී රැකියාව කිරීමට මැලිකමක් දක්වති. අවිවාහක කාන්තාවන් පවා ඇඟලුම් කර්මාන්ත ශාලා වැඩි වශයෙන් ස්ථානගත වී ඇති නාගරික ප්‍රදේශවල සංක්‍රමණය වීමට මැලිකමක් දක්වන්නේ ආරක්ෂක නවාතැන් පහසුකම් සොයා ගැනීමේ දුෂ්කරතාවය නිසාය. නමුත් තම පවුල රැක ගැනීමේ අරමුණ නිසාවෙන් දුරබැහැර ප්‍රදේශවලට සංක්‍රමණය වී නේවාසිකව නවාතැන් ගනිමින් තම පවුලට අවශ්‍ය කරන වියදම් ලබාදීම සිදු කරනු ලබයි. ( කිරිඇල්ල, 2020)

1980 ගණන්වල ආර්ථික ප්‍රතිසංස්කරණ මගින් දුප්පත් නූගත් ග්‍රාමීය කාන්තාවන් සඳහා රැකියා වෙළඳපොළක් නිර්මාණය කරන ලද නිමි ඇඳුම් කර්මාන්තයේ බොහෝ දුරට නාගරික ප්‍රදේශවල පිහිටා ඇත.  වැටුප් සහිත වැඩ සඳහා මෙම වැඩි සහභාගීත්වය මෙම කාන්තාවන්ගේ ලිංගභේද භූමිකාවන් වෙනස් කර ඇත.  කාන්තාවන්ගේ ඉපැයීම් ඔවුන්ගේ පවුලට ආධාර කරයි, නමුත් ඔවුන්ගේ මානසික සෞඛ්‍යයට සහ යහපැවැත්මට බලපෑම් ඇති කරමින් ඔවුන් තම දරුවන්ගෙන් ද වෙන් කරනු ලැබේ.  මෙම අධ්‍යයනයෙන්  කාන්තාවන් බොහෝවිට අධික ආතති තත්වයන් යටතේ වෙර දරන නිසා නිමි ඇඳුම් කර්මාන්තයේ සේවය කරන කාන්තාවන්ගේ සජීවී අත්දැකීම් ගවේෂණය කරයි. කාන්තා සංක්‍රමණික සේවිකාවන් ග්‍රාමීය ප්‍රදේශවලින් සංක්‍රමණය වීමට දිළිඳුකම ප්‍රධාන පෙළඹවූ සාධකයක් විය. තම මවගේ සේවා තත්ත්වයන් සහ දරුවන් රැකබලා ගැනීමේ හිඟකම නිසා ඔවුන්ගේ දරුවන් ඔවුන්ගේ ආච්චිලා සීයලා සමඟ ඔවුන්ගේ ගමේ රැඳී සිටිති. කාන්තාවන් ආතතිය, කාංසාව, නොසන්සුන්කම සහ සියදිවි නසාගැනීමේ සිතුවිලි වාර්තා කළ අතර, වැඩ කිරීමේ ද්විත්ව බර සහ තම දරුවන්ගෙන් වෙන්වීම සහ  තවද, ඔවුන්ගේ දිගු සේවා කාලය හේතුවෙන් ඔවුන්ට පහසුවෙන් රජයේ රෝහල් සේවාවන් වෙත ප්‍රවේශ විය. මේ අනුව ඇඟලුම් කර්මාන්ත සේවිකාවන්ට  රැකියා කාර්යබහුලත්වය මත ඇතිවන කායික හා මානසික ගැටලු  ගෘහස්ථ ජීවිතයට සිදු කරන බලපෑම අධ්‍යයනය කිරීමේදී රැකියා කාර්යබහුලත්වය ය කායික හා මානසික ගැටලු අධ්‍යයනය කිරීම හරහා එය ගෘහස්ථ ජීවිතයට කෙතරම් දුරට බලපෑම් කරනවාද යන්න අවබෝධ කරගැනීමට මෙම පර්යේෂණය සිදු කරනු ලබයි.

## න්‍යායාත්මක පැතිකඩ

කෘත්‍යවාදී න්‍යාය පර්යේෂණයේ න්‍යායාත්මක පැතිකඩ විග්‍රහ කිරීම සඳහා යොදා ගන්නා ලදී.මෙහිදී කෘත්‍යවාදී නියාය ඇඟලුම් ආයතනය තුළ හා ගෘහස්ථ ජීවිතය තුළ සිදුවන කාර්යයන් ලෙස ද්විත්වයකි. ඇඟලුම් ආයතනය තුළ ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් සේවක කාර්යයන් මෙන්ම ආයතනික කාර්යයන් ද සිදු කෙරේ. ඒ එක් එක් කාරයන් සඳහා එක් එක් වගකීම් ඇගලුම් කර්මාන්ත සේවිකාවන්ට සිදුකිරීමට ඇති අතර මෙම කෘත්‍යවාදී

න්‍යාය හරහා එම කාර්යයන් විග්‍රහ කර හැක. ගෘහස්ථ ජීවිතය තුළ කාන්තාවකට සිදුකිරීමට ඇති කාර්යයන් කෘත්‍යවාදී න්‍යාය හරහා විග්‍රහ කිරීම සිදුකරනු ලබයි.

පර්යේෂණයේ වැදගත්කම

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබෙන ගැටලුවක් වන්නේ සේවා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමයි. විශේෂයෙන්ම මෙම ගැටලුව අවම කරමින් එනම් ශ්‍රී ලංකාවේ විශාල පිරිසක් සේවා නියුක්ති අවස්ථාව උදාකර දීමට ඇඟලුම් කර්මාන්තය සමත් වී තිබේ. මෙම ඇඟලුම් ක්ෂේත්‍රයේ නියත වූවන් විශාල වශයෙන් තම අවශ්‍යතා ඉටුකර ගනිමින් ආර්ථික තත්ත්වය නගා සිටුවා ගැනීමට උත්සාහ කරනු ලබයි රට තුළ සේවා නියුක්ති අවස්ථා බිහි කරන ප්‍රධාන කර්මාන්තයක් වන නිසා මෙම කර්මාන්ත ක්ෂේත්‍රය අධ්‍යයනය කිරීම වැදගත් වේ. එමෙන්ම මෙම ඇගලුම් ක්ෂේත්‍රය නගා සිටුවීමට හා විදේශ විනිමය ළඟා කරදීමට විශාල වශයෙන් සේවයේ නිරත වන්නේ කාන්තාවන්ය. ඍජු හා වක්‍ර රැකියා තත්ත්වයන් යටතේ රැකියාවල නිරත වෙන කාන්තාවන් බොහෝය. මෙම නිසාවෙන්ම මොවුන්ට විවිධ නම් වලින් "ජුකී කෙල්ලන්" යන නාමයන්ගෙන් හැඳින්වීම ද දක්නට ලැබේ. ගමෙන් නගරයට සංක්‍රමණය වී රැකියාවල නිරත වී විශාල සේවයක් සිදුකිරීම නිසාවෙන් මෙම ඇඟලුම් ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් කෙරෙහි අධ්‍යයනය කිරීම ද වැදගත් වේ.

විවාහක හා අවිවාහක තත්ත්වයන්වල පෙළෙන කාන්තාවන් නේවාසිකව මෙම රැකියාවල නිරත වේ. මේ නිසාවෙන් තම පවුල රැකබලා ගැනීම දරුවන් හා ස්වාමිවරුන්ට ශක්තියක් වීම වැනි කරුණු කෙරෙහි මෙම රැකියාව බලපෑම් කරනු ලබයි. මෙම නිසාවෙන් ඇඟලුම් රැකියාව තුළ නිරත වන කාන්තාවන්ගේ රැකියා තත්ත්වය ගෘහස්ථ ජීවිතයට සිදු කරන බලපෑම හැදුනා ගැනීමට මෙම පර්යේෂණය වැදගත් වේ. එමෙන්ම මෙහිදී මෙම ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන්ගේ රැකියාව තුළ ඇති පීඩනය ගෘහස්ථ ජීවිතයට සිදු කරන බලපෑම හඳුනා ගැනීම හා ඊට විසඳුම් තීරණය කිරීම ගෘහස්ථ සාමාජිකයන් ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන්ගේ රැකියාව පිළිබඳ දක්වන ආකල්ප හඳුනාගැනීම ගෘහස්ථ ජීවිතයට ඇති කරන බලපෑම් සඳහා සමාජ වැඩ ආකෘතියක් හඳුන්වාදීම, පවුලේ ආර්ථික සමාජීය ගැටලු හඳුනාගැනීම, උපදේශනය ලබාදීම, නව ප්‍රතිපත්ති සංවර්ධනය කිරීමේ හැකියාව ඇත. පර්යේෂණයෙන් ලැබෙන දැනුම ප්‍රතිඵල සහ නිගමන සමාජයේ විවිධ මට්ටම්වල ප්‍රජාව දැනුවත් කිරීමට මෙම අංශය පිළිබඳ ගැඹුරු පර්යේෂණයක් කිරීම වැදගත් වේ. මෙමගින් පවුලේ සාමාජිකයන් හට රැකියාව පිළිබඳ මෙන්ම රැකියාව තුළ නිරතවන නැගණිය මව දුවව කෙරෙහි අවබෝධයක් ලබාගැනීමට හා ඇයට අවශ්‍ය සහයෝගය ලබාදීමට මෙම පර්යේෂණය වැදගත්වේ.

තවද වර්තමාන තරගකාරී ආර්ථික පර්යාවරණය යටතේ පවුල් ආර්ථිකය රඳවා තබා ගැනීම සඳහා ස්වාමියා හා භාර්යාව දෙදෙනාම රැකියා වෙත යොමුවන අවශ්‍යතාව වැඩිව ඇති අතර, විශේෂයෙන් අඩු අධ්‍යාපන සහ ආර්ථික සම්පත් සහිත ග්‍රාමීය කාන්තාවන් නගර ප්‍රදේශ වෙත සංක්‍රමණය වී ඇඟලුම් කර්මාන්තයේ රැකියා ලබා පවුලේ වියදම් සපුරාලීමේ උත්සාහයේ නිරත වෙති. ඒත්, සමාජය තුළ මෙම කාන්තාවන් පහත් අගයක් ඇති ගණිකාවන් ලෙස සමාජීයව තක්සේරු කිරීමෙන් ඔවුන්ට විවිධ ආකාරයේ ලැජ්ජාදායක තත්ත්ව, පැහැර හැරීම් සහ මනෝසමාජීය පීඩනයන්ට ලක්වීමට සිදුවෙයි. මෙම පසුබැසීමේ හා බලාපොරොත්තු

තත්ත්වයන් යටතේ කාන්තාවන් රැකියා වගකීම් සහ පවුල් කාර්ය භාර අතර සමානාත්‍යතාව රඳවා ගැනීම අසීරු වීම නිසා, රැකියාවේ පීඩනය ගෘහස්ථ ජීවිතයට ඇතිවන බලපෑම් සඳහා වහා විසඳුම් සෙවීම කාලීන අවශ්‍යතාවය වේ.

පර්යේෂණ ක්‍රමවේදය

දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස සම්මුඛ සාකච්ඡා සිදු කරනු ලැබූ අතර තෝරාගත් ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් සමඟ සම්මුඛ සාකච්ඡා සිදු කරනු ලැබූ අතර එමෙන්ම ඔවුන්ගේ පවුල් සමඟ සාකච්ඡා සිදු කරන ලදී. එමෙන්ම සිද්ධි අධ්‍යයනයද යොදා ගනු ලැබූ අතර එමගින් ඇගලුම් කර්මාන්තයෙන් නියුතු කාන්තාවන්ගේ විවිධ සිද්ධි දාමයන් හරහා ඇති වූ ප්‍රතිඵල මත පර්යේෂණයට අවශ්‍ය කරන සත්‍ය දත්ත ලබා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා හා සිද්ධි අධ්‍යයන ප්‍රාථමික දත්ත මගින් රැස් කරගෙන ලැබූ අතර ද්විතීක දත්ත පොත් පත් සඟරා පෙර පර්යේෂණ ලිපි මගින් අධ්‍යයනය කටයුතු සඳහා යොදාගන්නා ලදී. දත්ත විශ්ලේෂණය තේමාත්මක විශ්ලේෂණය හරහා සිදු කරනු ලැබූ අතර එක් එක් තේමාවන් සඳහා අවශ්‍ය කරන කරුණු තේමාත්මක විශ්ලේෂණය හරහා විශ්ලේෂණය කිරීම සිදු කරන ලදී. පර්යේෂණ අධ්‍යයනය උදෙසා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයේ යොදා ගන්නා බැවින් සමාජ පර්යේෂණ ක්‍රමවේදයන්ට අදාළව පවතින නියැඳියන් අතර ප්‍රධාන නියැදියන් වන සසම්භාව්‍ය නියැදිය සහ සසම්භාවී නොවන නියැදිය අතරින් පර්යේෂණය සඳහා භාවිතයට ගත හැකි නියැදිය ලෙස සසම්භාව්‍ය නොවන අරමුණු සහගත නියැදියට අදාළව ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් 20 දෙනෙකු තෝරා ගන්නා ලදී.

**අධ්‍යයන සොයා ගැනීම**

**ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ගැටළු**

ඇඟලුම් කර්මාන්තය 99% ක් කාන්තාවන්ගෙන් සමන්විත වන අතර බහුතරයක් වයස් සීමාව අවුරුදු 18 සිට 25 දක්වා වේ. බොහෝ කාන්තා සේවිකාවන් පැමිණෙන්නේ කෙටි කාලයක් සඳහා වැඩ කිරීමට සහ ඔවුන්ගේ විවාහයෙන් පසු කර්මාන්තයෙන් ඉවත් වීමටයි.

*"මම සීතාවක තමයි පදිංචි වෙලා ඉන්නේ කීයක් හරි හොයාගන්න තමයි කටුනායකට ආවේ. විවාහයට ඕන කරන බඩු ටික හදාගන්නඑකවත් බැරි වුණා. මේ රස්සාවෙ ඉන්නවා ඊට පස්සේ අයින් වෙලා ගම්පළාතෙම මොකක් හරි කරනවා" (කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ හැඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන කාන්තාවක් සමග සාකච්ඡාව - 1)*

මෙහිදී මෙම කාන්තාව ආර්ථික පසුබිම සහ ජීවන අරමුණු ප්‍රමුඛ කරගෙන පමණක් මෙම රැකියාවේ නිරතවීම දැකගතත හැකිය. තාවකාලික රැකියා පැවැත්ම මේ හරහා පෙන්වා දෙන අතර කාන්තාවක් තම ජීවිතයේ විශේෂ අවස්ථාවකට ආර්ථිකව සූදානම් වීමට මෙම ඇඟලුම් කර්මාන්ත වෘත්තිය භාවිතා කරන ආකාරය මෙහිදී දැක්වේ.එමෙන්ම ඇයගේ දිගු කාලීන සැලසුම හා රැකියාව වෙනස් කිරීමට ඇති බලාපොරොත්තුව හරහා ඇඟලුම් කර්මාන්තයේ යම් කිසි ගැටලුකාරී තත්ත්වයක් පවතින බව පෙනේ. මෙම සන්දර්භය තුළ ඇති ප්‍රධාන ගැටළුව වන්නේ ස්ථාවර ශ්‍රම බලකායක් ගොඩනැගීමට ඇති නොහැකියාවයි, එබැවින් ඵලදායිතාව සහ ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා විශාල උත්සාහයක් ගත

යුතුය. ඉහළ සාක්ෂරතා අනුපාතය සහ පහසුවෙන් පුහුණු කළ හැකි ශ්‍රම බලකාය රට සතුව ඇති වාසි වන අතර අද ශ්‍රී ලංකාව ලෝක වෙළඳපොලේ නමක් ස්ථාපිත කිරීමට මෙය එක් හේතුවකි.

**මෙහෙයුම් සහ සැපයුම් ගැටළු**

මෙම ඇඟලුම් කර්මාන්තය තුළ පවතින තවත් ගැටලුවක් නම් මෙහෙයුම් සහ සැපයුම් ගැටලු පෙන්වා දිය හැකිය.මෙහිදී අමුද්‍රව්‍ය ලබා ගැනීමේ සහ නිමි භාණ්ඩ බෙදා හැරීමේ ප්‍රමාදයන් මෙන්ම ගැනුම්කරුවන්ගේ ඉල්ලුම් සපුරාලීමට සහ තරගකාරීත්වය පවත්වාගෙන ගැනීමට කර්මාන්තයට ඇති හැකියාව අහිතකර ලෙස බලපෑමට ලක්විය හැකිය.එනම් මේ සඳහා දීර්ඝ කාලයක් වැය කිරීම නිසාවෙන් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබාදීමට නොහැකි වීම මෙම ක්ෂේත්‍රයේ පරිහානියට හේතු විය හැක.එමෙන්ම ශ්‍රී ලංකාව ඇඟලුම් නිෂ්පාදනය සඳහා ආනයනික අමුද්‍රව්‍ය මත දැඩි ලෙස රඳා පවතින අතර එම නිසා ගෝලීය සැපයුම් දාම බාධා සහ මිල උච්ඡාවචනයන්ට ඒ ගොදුරු වීමේ අවධානමක් පවතී.එම නිසාවෙන් ආනයනය මතයැපීම ක්ෂේත්‍රයේ පරිහානියට හේතු වන අතර අපනයනය අනුව අඩුවීම සහ අනෙකුත් අභියෝග හේතුවෙන් සමහර කර්මාන්ත ශාලා ඒවායේ සම්පූර්ණ ධාරිතාවයට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වන බව වාර්තා වෙයි.එම නිසාවෙන් සේවකයන්ගේ වැටුප් කප්පාදු කිරීම් හා රැකියා කප්පාදු කිරීම් ද දක්නට ලැබේ.

**සදාචාරාත්මක සහ සමාජීය ගැටළු**

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ සදාචාරාත්මක හා සමාජීය ගැටළු පෙන්වා දිය හැක. ගැනුම්කරුවන් ළමා ශ්‍රමය බලහත්කාර ශ්‍රමය වැඩ කරන වෙලාවල් සහ වැටුප් වැනි ගැටලු ඇතුළුව කර්මාන්තශාලාවල සේවා කොන්දේසි පිළිබඳ වැඩි සැලකිල්ලක් නොදක්වනු ලබයි.එමෙන්ම සෞඛ්‍ය හා ආරක්ෂාව සම්බන්ධව ප්‍රතිමාධාර ආරක්ෂක උපකරණ සහ ආරක්ෂාව පිළිබඳ සේවක තෘප්තිය නොමැති අතර සමහර කර්මාන්තශාලාවල සෞඛ්‍ය සහ ආරක්ෂක ප්‍රමිතියන් පිළිබඳ ගැටළු පවතින බව අධ්‍යයනය හරහා පැහැදිලි විය.එමෙන්ම සේවක අයිතිවාසිකම් හා සම්බන්ධව නිසි නියාමනයක් නොමැති වීම තවත් ගැටලුවකි**.**

**"***අධීක්ෂකවරිය මට කිව්වේ ඉවසල ඉන්න කියල මැදින් ලබා දෙන විවේක කාලය මත විතරක් ඒ සඳහා යන්ඩ කියලා කිව්වා මගේ අමාරුව දැනුනේ මට විතරයි. මගේ එහෙලියන් කිහිපදෙනෙක්ටත් මගේ අමාරුව දැනෙන තරමටම මට ආමාරුව තිබ්බා ඒත් ඇතුළින් කිසිම ප්‍රතිකාරයක් මට ලබාදුන්නේ නැහැ"*

(කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන කාන්තාවක් *සමග සාකච්ඡාව - 3)*

ඉහත කරුණු සේම වෙළඳපොළ සහ ආර්ථික සාධක වන උච්ඡාවචනය වන ඉල්ලුම තාක්ෂණික අනුගත වීම සහ නවෝත්පාදනය සඳහා ඇති මූල්‍ය හා දැනුම බාධක මෙම ඇඟලුම් කර්මාන්තය තුළ පවතින ගැටළු ලෙස පෙන්වා දිය හැක.

**ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ට පවතින ගැටලු**

**ස්ත්‍රී පුරුෂභාවීය අසමානතාව**

ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන් පෙන්වා දෙන ආකාරයට කාන්තාවන් මෙම රැකියාව තුළ රූකඩ සේ නැටවීමට සැලැස්වීම ආයතන ප්‍රධානීන් විසින් සිදු කරනු ලබන බවත් නමුත් පිරිමින්ට ඒ ආකාරයෙන්ම සැලකීම් නොකරන බවත් පෙන්වා දෙයි. කාන්තාවක් යමක් ඉල්ලුවත් එය නොසලකා හරිනු ඇත. නමුත් පිරිමින් විසින් මතු කරන ඉල්ලීම් කෙරෙහි යම් සැලකිල්ලක් දැක්වෙන බව ඔවුන්ට වැටහෙන කරුණක් බව පෙන්වා දෙයි. නමුත් ආයතන ප්‍රධානීන් මෙන්ම සමාගම් පිරිමි සේවකයින් සේවයේ යෙදවීමේ ප්‍රවණතාවය සිතා මතාම අඩු කරනු ලබයි. එයට හේතුව බවට පත්වන්නේ කාන්තාවක් පාලනය කිරීමට රැකියාව ලැබුණත් පිරිමි පුද්ගලයකු පාලනය කිරීමට යම්තාක් අසීරු නිසාවෙනි. එයට හේතු ගණනාවක් ඔවුන් විසින් පෙන්වා දෙයි. අයිතීන් වෙනුවෙන් පෙනී සිටීම.අසාධාරණයට ලක් නොවීම ලිංගික හිංසනයට ගොදුරු නොවීම, රැකියාවේ පලපුරුද්දක් නොමැතිකම, රැකියාවෙහි පවතින ගැඹුරු බව නොදැනීම රැකියා වගකීම් හරිහැටි ඉටු නොවීම. එයට හේතුවේ. කාන්තා සේවිකාවන් වාර්තා කරන්නේ කර්මාන්ත ශාලාවේ කාන්තාවන් පිරිමි කළමනාකරුවන් විසින් හිරිහැරයට ලක් කරන බවයි. ඔවුන් ගැහැණු ළමයින් වෙත පැමිණ, ඔවුන්ගේ කාර්යාලවලට කැඳවා, ඔවුන්ගේ කන්වලට කොඳුරමින්, ඔවුන් ස්පර්ශ කර, මුදල් අල්ලස් දී ඔවුන් සමඟ ලිංගිකව හැසිරුනේ නැත්නම් සේවයෙන් පහ කරන බවට තර්ජනය කරති.

*"මට නිතරම කෙටි පණිවිඩ එන්න ගත්තා මං මේ ගැන පැමිණිලි කරත් දිගටම මේ රස්සාවේ ඉන්න ඕනේ නැද්ද උඹට කියලා ඇහුවා මම දන්න නෝන කෙනෙක්ට කියලා ඒ සර් ඉන්න තැනින් මං වෙන තැනකට මාරු උනා"*(කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ හැඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන කාන්තාවක් *සමග සාකච්ඡාව - 4)*

**ස්වාධීනත්වයට බාධා එල්ල වීම.**

කාන්තාවන් පවුල් ආරම්භ කිරීමට හෝ දැනටමත් පවුල් ඇති කර ගැනීමට තීරණය කළ පසු ඔවුන්ටද වෙනස්කම් කරනු ලැබේ. සමහර ඇඟලුම් කම්හල්වල, කාන්තා අයදුම්කරුවන්ගෙන් ඔවුන් විවාහකද නැතහොත් දරුවන් ලැබීමට සැලසුම් කරන්නේද යන්න විමසනු ලැබේ. සමහර සේවා යෝජකයින් දරුවන් නොමැති අවිවාහක කාන්තාවන් පමණක් බඳවා ගන්නා අතර සමහරු සෑම කාන්තාවක්ම තම සේවා කාලය තුළ දරුවන් නොලැබීමට එකඟ වන බවට ලියවිල්ලකට අත්සන් කිරීමට බල කරති. බඳවා ගැනීමේ අදියරේදී අනිවාර්ය පරීක්ෂණ ඉතා සුලභ ය. ගර්භනී කාන්තාවන් හෝ පරීක්ෂාවට ලක්වීම ප්‍රතික්ෂේප කරන අය සරලවම බඳවා නොගනී. තම රැකියාව අතරතුර ගැබ් ගන්නා කාන්තාවන් එය සැඟවීමට උත්සාහ කළ හැකි අතර, බොහෝ විට උපත් ආබාධ සහ අනෙකුත් ළමා ආරක්ෂණ ගැටළු ඇති කරයි.ගර්භනී සේවකයින් මුහුණ දෙන හිරිහැරවලට වාචික අපයෝජනය, ඉහළ නිෂ්පාදන කෝටා, දිගු වැඩ කරන වේලාවන් සහ වාඩි වී සිටීම වෙනුවට සිටගෙන සිටීම වැනි වඩාත් දුෂ්කර කාර්යයන් ඇතුළත් වේ.

**ශාරීරික ආබාධ ඇතිවීම**

ශාරීරික ආබාධ ඇතිවීම සුලබ වශයෙන් ඇගලුම් කර්මාන්ත සේවිකාවන් තුළ දක්නට ලැබේ. එහිදී කොන්දේ කැක්කුම ඇස් පෙනීමේ දුර්වලතා කකුල් කැක්කුම් ප්‍රධාන වශයෙන් දැක ගැනීමට හැකියාව ලැබේ. ඒකාකාරී ලෙස තම රැකියාව තුළ නිරතවීම නිසාවෙන් මෙම තත්ත්වයන්ට මුහුණ දීමට කාන්තාවන්ට සිදු වී ඇත. එම රෝග ලක්ෂණ නිසාවෙන් ඔවුන්ගේ රැකියාව හරහා ගෘහස්ථ ජීවිතයේ පවත්වාගෙන යාමේදී විශාල වශයෙන් ගැටලු වලට මුහුණ දීමට සිදුවේ එදිනෙදා ජීවිතයේදී තම නිවසේ කාර්යභාරයන් ඉටු කර ගැනීමේදී මෙම ශාරීරික ආබාධ නිසාවෙන් ඔවුන්ගේ එම කටයුතු අතපසුවීම දක්නට ලැබේ. සාමාන්‍යයෙන් මෙම ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රය නැතුව කාන්තාවන්ට අස්ථි වර්ග ගැටලු සහ ගබ්සා ගැටලු මෙන්ම කොන්දේ කැක්කුම් වැනි රෝගවලින් පෙළෙන බව හෙළි විය.

**චර්යාමය ගැටලු ඇතිවීම.**

පවුලේ පිරිස සමඟ නිරන්තරයෙන්ම ආවේගශීලි ලෙස ක්‍රියා කිරීම මෙම කාන්තාවන්ගේ දක්නට හැකි ලක්ෂණයකි. දරුවන් සමඟ මෙන්ම ස්වාමිපුරුෂයන් හා දෙමාපියන් සමඟ සිදු කළයුතු කටයුතු සාකච්ඡා කිරීමේදී ඔවුන්ට ආවේගීශීලී හැඟීම් ඇතිවෙන බවත් රැකියාවේ පවතින කාර්යබහුලත්වය සමඟ නිවසට පැමිණීමේදී විවේකය සෙවීම අරමුණු ඇතුව පැමිණියත් නිවසේ කටයුතු හරහා නිරන්තරයෙන් ආවේගශීලී හැඟීම් මතුවන බව ඔවුන් විසින් ප්‍රකාශ කරනු ලබයි.

**රැකියා තත්ත්වය මත ගෘහස්ථ ජීවිතයේ ඇතිවන ගැටල**

ඇතැම් කාන්තාවන් මෙම රැකියාව සිදුකිරීම සම්බන්ධයෙන් තම ස්වාමිපුරුෂයා හා දෙමව්පියන්ගේ අකමැත්ත ඇත. ඒ නිසාවෙන් ඔවුන් රැකියාවට යාම සහ ඒ සම්බන්ධව දෙමාපියන් සහ ස්වාමිපුරුෂයන් දරන්නේ විවිධ මතය. ඒ නිසාවෙන් ඔවුන් අතර විවිධ මත ගැටුම් නිර්මාණය වේ. ඇතැම් වෙලාවට ඔවුන් දික්කසාදය දක්වා යාම පවා දක්නට ලැබේ. මේ නිසාවෙන් රැකියා තත්ත්වය ගෘහස්ථ ජීවිතයට බලපාන ආකාරය සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීමේදී මෙම මත ගැටුම ඇතිවීම ප්‍රධාන වශයෙන් දක්නටට ලැබේ.

"මෙහෙමය ඉතින් සමහර වෙලාවට මගේ පඩිය මදි ජීවත් වෙන්න.මහත්තයත් කුලී වැඩ කරන කාලෙට නම් ෂේප් උනහැකි නැත්තං ඉතින් පවුල වියදම් කරන්න ගියාම දෙන්නගෙම අතේ සතේ නැතුව උඩ බලාගෙන තමා ඉන්න වෙන්නේ.මහත්තයා මට බනින්නේ මං ගාන ක්‍රීම් වල ගාන වැඩෙන හින්දා පවුලට ඕන දේවලුත් කරගන්න බෑ කියලා.ඒත් ඉතින් අපිත් ලස්සනට ඉන්න ඕනනේ ගොඩක් වෙලාවට ඔය දේවල් වලට රණ්ඩු වෙනවා" *( කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ හැඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන කාන්තාවක් සමග සාකච්ඡාව - 7 )*

සාමාන්‍යයෙන් ඇඟලුම් කර්මාන්තයෙන් නිරතවන මෙම කාන්තාවන් උදෑසන හෝ රාත්‍රී තම රාජකාරිය සිදු කිරීමට යාමේදී ඔවුන්ගේ නෑදෑ හිතමිතුරන් මුණ ගැසෙන ප්‍රමාණය අවම වීම සිදුවේ. ඔවුන්ගේ රාජකාරිය කෙතරම් කාර්යබහුල ද යත් ඇතැම් අවස්ථාවලදී ඔවුන්ට උත්සව කාලසීමාවන් තුළද තම සේවා මුරයන් ඒ ආකාරයෙන්ම සිදු කරමින් නිවාඩු නොමැතිව විවිධ පීඩාවන්ට යටත්ව සිදු කළ යුතු බව හෙළි විය. එම නිසාවෙන් ඔවුන් ඉතා

අසීරු තත්ත්වයන්ට මුහුණ දෙන්නට සිදුවූ අවස්ථා බොහෝ බව ප්‍රකාශ කරනන ලදී. එම නිසා බාහිර සමාජය සමඟ පවත්වන සම්බන්ධතා බොහෝ දුරට අවම වී පවතින බව ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් ප්‍රකාශ කරන ලදී.

**පවුලේ සාමාජිකයන්ගේ ආහාර අවශ්‍යතා මඟ හැරීම.**

කාන්තාවන් රැකියා සිදුකිරීම සමාජය තුළ බහුල වශයෙන් දැකගැනීමට වර්තමානය වන විට හැකියාව පවතී බොහෝ දුරට මෙම කර්මාන්තයේ නිරත වන කාන්තාවන්ගේ නිවෙස් වල දරුවන්ට හරි ආකාරව තාම විසින් සකස් කරනු ලබන ආහාර ගැනීමට අවස්ථාව අහිමි වී පවතී. ඒ බව දරුවන් සමඟ සාකච්ඡා සිදු කරන අවස්ථාවලදී දරුවන් ප්‍රකාශ කරන ලද අවස්ථා පැවතුණි ඔවුන්ට අම්මාගේ අතින් ආහාර පිස ආහාරයට ගැනීමට ඇති අවස්ථාවන් මග හැරෙන බවත් ආහාර පිසුවාත් ඉතා ඉක්මනින් ආහාර තනා ගැනීමට හැකියාව ඇති ආහාර පමණක් සාදා දෙන බව ප්‍රකාශ කරන ලදී. මේ නිසාවෙන් දරුවන්ගේ ආහාර අවශ්‍යතා මගහැරී ගොස් ඇති බවද පර්යේෂණය හරහා අනාවරණය විය.

**දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වීම**

බොහෝ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අතරමග පසුබෑමකට ලක්වන අවස්ථා පවතින බව පර්යේෂණය හරහා අනාවරණය විය. බොහෝ දරුවන් තම දෙමාපියන්ගේ උපදෙස් මග පෙන්වීම යටතේ අධ්‍යාපන කටයුතු සිදු කරනු ලබන අතර අතරමගදී එම අධ්‍යාපන කටයුතු නතර වුවහොත් ඒ ඉතා ගැටලුකාරී තත්ත්වයකි. මෙහිදී අධ්‍යාපන කටයුතු දරුවන් සිදු කරනු ලැබුවත් මව නිරන්තරයෙන් නිවසේ නොසිටීම නිසාවෙන් දරුවන් නොමඟ යාම හා අධ්‍යාපන කටයුතු අතපසු කිරීම දක්නට ලැබෙන කරුණක් වේ. මේ නිසාවෙන් ඇතැම් දරුවන් නිවෙස් වලින් පැන යාම ප්‍රේම සම්බන්ධතා ඇතිකර ගැනීම අධ්‍යාපන කටයුතු තවදුරටත් අතරමග නැවතීමට කාරණා බව පර්යේෂණ හරහා අනාවරණය වී ඇත**.**

"මගේ මේ වැඩ එක්ක ළමයින්ගේ වැඩ නං ගොඩක් අතපසු වෙනවා දැන් කාලේ ඉංග්‍රීසි ඕනෙම හින්දා ඉන්ටනෙෂනල් ඩිස්කෝලෙකට දැම්මා හැබැයි ඒවට දැම්මා වගේ නෙමෙයි යන වියදම එක බලනකොට මට ඒ වැඩ කියලා දෙන්නත් කාලයක් නෑ ඉස්සර නම් ගියේ ගමේ ඉස්කෝලෙට දැන් දුව ඉන්නෙ හතර වසරේ මම මේ ඉස්කෝලෙට දැම්මේ හතර වසරෙන් මෙයාට දැන් පාඩම් ඉංග්‍රීසියෙන් යන හින්දා පාඩම හරියට අල්ල ගන්න අමාරුයි.මටත් කියලා දෙන්න වෙලාවක් නැති හින්දා එයා ඉස්කෝලෙ යන්නත් බෑ කියනවා"*(කටුනායක නිදහස් වෙළඳ කලාපය තුළ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත වන කාන්තාවක් සමග සාකච්ඡාව -7)*

**නිවසේ කටයුතු අතපසුවීම දෙමාපියෝ දූදරු සබඳතා දුර්වල වීම ස්වාමිපුරුෂයා හා ඇති සබඳතාවයන් දුර්වල වීම.**

එහිදී නිවසේ කටයුතු අතපසු වීමද තවත් එක් හේතුවකි. රැකියාවන් හා ගෘහස්ථ කටයුතු හරියාකාරව සිදු කරනු ලබන්නේ ඉතාමත් අඩු පිරිසකි. බහුතරයක් එම කටයුතු හරියාකාරව සිදු කරන්නේ නැත. මෙම නිසාවෙන් ඇතැම් නිවෙස ඉතා අප්‍රසන්න ලෙස අපවිත්‍ර ඇති අවස්ථා නිරීක්ෂණ හරහා පෙනුණි. එමෙන්ම පෙර පැවැති සුන්දර නිවාස රැකියා තත්ත්වය තුළ පවතින කාර්යබහුලත්වය නිසාම එම සුන්දරත්වය වියැකී ගොස් ඇත. දෙමාපිය දූ දරු සම්බන්ධතාවයන් බොහෝ දුරස්ථභාවයට පත්වී ඇතැයි කුඩා දරුවන් අවදිවන අවස්ථාවලදී

තම මව නිවසේ නොමැති අතර දරුවා නැවත රාත්‍රියේ නින්දට යන අවස්ථාවලදීද මව ඔවුන් සමඟ නොමැත ඔවුන්ව රැක බලා ගන්නේ අත්තම්මාගේ හෝ සීයා වූ වෙනත් රැකබලා ගන්නන් විසිනි. මෙම නිසාවෙන් මෙම ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් තමන්ගේ දරුවන්ගෙන් දුරස්ව ස්වභාවයක් පෙන්නුම් කරයි. එමෙන්ම තරුණ දියණියන් රැකියාව නිසාවෙන් වෙනත් ප්‍රදේශයක කුලියට සිටිමින් රැකියාව සිදු කරනු ලබන අතර එම නිසාවෙන් තරුණ දරුවන්ට දෙමව්පිය දූදරු සම්බන්ධතා දුරස්ථභාවයට පත්වන අවස්ථා දෙක ගත හැකි විය. ස්වාමී පුරුෂයා සමගද සම්බන්ධතාවයන් දුර්වල වීම නිසා දික්කසාද බව හා වෙන්ව ජීවත්වෙන අවස්ථා දැක ගැනීමට හැකි විය. කාන්තාවන් නිවසට පැමිණෙන්නේ ඉතාමත් වෙහෙසට පත් වී නිසාවෙන් ලිංගික කාර්යයන් පවා හරියාකාරව සිදුකර ගැනීමට ඔවුන් පෙළඹෙන්නේ නැත. මෙවැනි පවුලේ කෘත්‍ය හරහා ලිංගිකාර්ය ප්‍රජනනකාර්ය අතපසුවීම හරහා ස්වාමියා සමග පවතින සම්බන්ධතාවයන් දුරස් වීම පවුල් තුළ මෙම රැකියා තත්ත්වය නිසා සිදුවන අහිතකර බලපෑමක් ලෙස අනාවරණය කර ගැනීමට හැකි විය.

**ගෘහස්ථ සාමාජිකයන් ඇඟලුම් කර්මාන්තයේ නියුතු කාන්තාවන්ගේ රැකියාව පිළිබඳ දක්වන ආකල්ප**

ඇඟලුම් කර්මාන්තයේ කාන්තාවන් කෙරෙහි දක්වන ආකල්ප විවිධාකාර වේ. සමහර පවුල් එය මූල්‍ය ස්වාධීනත්වයට සහ සමාජ සංචලතාවයට මාර්ගයක් ලෙස දකින අතර තවත් සමහරු එය සමාජීය වශයෙන් නුසුදුසු හෝ සදාචාරාත්මකව පහත් දෙයක් ලෙස සලකමින් නිෂේධාත්මක හැඟීම් දරති.මෙම වෙනස් දෘෂ්ටිකෝණ බොහෝ විට සමාජ සම්මතයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ භූමිකාවන් සහ ආර්ථික සාධක මගින් හැඩගැසී ඇත.

**රැකියාව අවම ගෞරවයෙන් යුත් රැකියාවක් ලෙස ප්‍රකාශ කිරීම.**

බොහෝ අවස්ථාවලදී පවුල තුළින් මෙන්ම ඇඟලුම් කර්මාන්ත සේවිකාවන්ගේ සම්මුඛ සාකච්ඡා හරහා පෙනෙන්නට පැවතුණු කරුණක් නම් තම රැකියාවට කිසිදු ගෞරවයක් නොමැති බවයි. බොහෝ දෙමව්පියන් තමන්ගේ දරුවන් නිවසට වී සිටියත් ඇඟලුම් කර්මාන්තයට ප්‍රවේශ වෙනවාට එතරම් කැමැත්තක් දක්වන බවක් දක්නට නොමැත. එයට හේතුව බවට පත්වන්නේ වර්තමාන සමාජය තුළ ජුකී කෙල්ලන් යන අනුවර්තනාමයෙන් ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් හඳුන්වන නිසාවෙන් මෙම රැකියාවට ඇති වී ඇති පහත් ගෞරවය නිසාවෙනි.

**අවම වැටුපක් ලැබෙන රැකියාවක් ලෙස ප්‍රකාශ කිරීම.**

සාමාන්‍යයෙන් මෙම රැකියාවට අවම වැටුමක් ලැබෙන බව ප්‍රකාශ විය.සාමාන්‍යයෙන් උසස් පෙළින් පසුව කාන්තාවන් තරුණ අවදියේම රැකියාව සිදුකිරීමට ඇඟලුම් කර්මාන්තය තෝරා ගනු ලබන අතර ඔවුන්ගේ බලාපොරොත්තු ඇතැම් විට රුපියල් 25000කට සීමා වන අවස්ථාද දැක ගත හැකි විය එමෙන්ම ඔවුන්ගේ නිවෙස් වලින් විරුද්ධ වූවා තෙම රැකියාවන් සඳහා යනු ලබන්නේ අනාගත අරමුණු සාර්ථක කර ගැනීමට අවශ්‍ය කුඩා මුදලක් හෝ සොයා ගැනීමට අරමුණු කරගෙන බව පර්යේෂණය හරහා අනාවරණය විය.

"විසි පන්දහේ පඩියෙන් මොනව කරන්නද කියලා හැමදාම කියනවා.ඒත් ඔය එයාට ඕනා රත්තරන් බඩු ටික හදාගන්න කියලනෙ ඔය යන්නෙ වෙලාවකට ඔය 25000ත් නෑ 18ක් වගේ නැහිල නැහිල අරන් එන්න එද්දි මන් නම් ඕකෙන් කියක්වත් ගෙදර වියදමට ගන්නෙ නෑ" (*ඇඟලුම් කර්මාන්යේ නියුතු කාන්තාවකගේ මව සමග සාකච්ඡාව - 2).*

**පීඩනයක් හෝ කිසිදු බලපෑමක් නොමැති රැකියාවක් ලෙස සිතීම.**

ඇතැම් අවස්ථාවලදී අනෙක් රැකියාවන්ට සාපේක්ෂව කිසිදු පීඩනයක් නොමැති රැකියාවක් ලෙස මෙම ඇඟලුම් කර්මාන්තය පෙන්වා දුන් අවස්ථාව දැකගැනීමට හැකි විය.විවිධ පුද්ගලයන් විවිධ මත දැරීම නිසාවෙන් ඇතැම් විට මෙම කාන්තාව සිදු කරනු ලබන මෙම භාරදූර කාර්ය පිළිබඳ ඔවුන් නොසලකාම ලබන්නේ සමාජය තුළ ඔවුන්ට ඇති පිළිගැනීම අවම මට්ටමක පැවතීම නිසාවෙන් බවත් ඔවුන්ගේ මෙම කාර්යභාරය ඇතැම් විට හැල්ලුවට ලක්වන අවස්ථාවන් ඇති නිසාවෙන්මය.

"එයාට නං ඉතින් තියෙන්නේ උදේ හයට යනවා එක්කෝ රෑ හයට යනවා නයිට් එක කරොත් ඇවිත් නිදාගන්නවා ඩේ එක  කරොත් ඇවිත් ඒත් නිදාගන්නවා එතන ඉතින් ලොකු වැඩකුත් නැනේ තමන්ට දෙන ටාගට් එක කරන්න තියෙන්නේ එහෙම ලොකු පීඩනයක් නෑ" *(ඇඟලුම් කර්මාන්යේ නියුතු කාන්තාවකගේ සහෝදරයා සමග සාකච්ඡාව - 3)*

**රැකියාව හරහා පවුල අවශ්‍යතා පිරිමසා ගැනීමට නොහැකි බව ප්‍රකාශ කිරීම, රැකියාව ප්‍රකාශ කිරීමට අකමැති වීම.**

ඇතැම් අවස්ථාවලදී රැකියාව මගින් ලබා ගන්නා මුදල පවුලේ අවශ්‍යතා සපුරා ගැනීමට බොහෝ දුරට නොහැකි බව ප්‍රකාශ කරන ලදී එයට හේතුව බවට පත්වන්නේ නේවාසිකව සිටින අවස්ථාවලදී නේවාසික ස්ථානය සඳහා මුදලක් වැයවීම මෙන්ම ආහාර සඳහා මුදලක් වැයවීමය. ඇතැම් සේවිකාවන් සඳහා සාමාන්‍ය රු.50000 කට ආසන්න මුදලක් ලැබුනත් එයින් අඩකට ආසන්න ප්‍රමාණයක් භෞතික අවශ්‍යතා සඳහා වැයවීම නිසා ලබා ගන්නා මුදල ප්‍රායෝගික නොවන බව ප්‍රකාශ කරන ලදී ලදී. පවුලේ අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි අවස්ථා බොහෝමයක් ඒ හරහා ඇතිවන බව ප්‍රකාශ කරන ලදී උදාහරණ වශයෙන් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිවසට අවශ්‍ය කරන ආහාර ද්‍රව්‍ය ඇඳුම් පැළඳුම් ලබා ගැනීම සෞඛ්‍ය අවශ්‍යතා සඳහා ප්‍රමාණව නොවන බව ප්‍රකාශ කරනු ලැබුවාය. ඇතැම් අවස්ථාවලදී රැකියාව සිදු කිරීමට ස්වාමිපුරුෂයා විසින් බාධා පමණ වන්නේ රැකියාව සිදුකිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් නොවන නිසාවෙනි.

"මම නං හරිම අකමැතියි මෙයා ගාමට යනවා කියලා කියන්නත් මොකද අපේ පවුලේ කවුරුත් ගාමන්ඩ් ගිහින් නෑ.අනික ඔය ගාමන්ට යනවා කියන්නේ එච්චර හොඳ අය නෙමෙයි කියලයි හැමෝම කියන්නේ හින්දා මාත් වැඩිය මෙයා ගමට යනවා කියලා කාටවත් කියන්නේ නෑ.අනික මාත් ජොබ් එකක් කරන එකේ මෙයාට මේ රස්සාවෙන් හම්බෙන පඩියෙන් මේ හැමදේම කරන්න බෑ.ගෙදර උන්නත් ගියා කියලත් ලොකු වෙනසක් නෑ.මංගල සමහර වෙලාවට ගෙදර එන වෙලාවටත් මෙයා ඇවිල්ල නෑ.සමහර

වෙලාවට අපේ නැදැයෝ ගෙදරට ආවාම නෝනා කෝ කියලා අහපුවාම එයා වැඩ කිච්චහම ආ ගාමන්ට් නේද කියනවා.මත් ඔව් කියල නිකන් ඉන්නවා" *( ඇඟලුම් කර්මාන්යේ නියුතු කාන්තාවකගේ ස්වාමියා සමග සාකච්ඡා - 4)*

**සමාජ ලේබල්කරණය නිසා සමාජයේ දොස් ඇසීමට සිදුවීම.**

සාමාන්‍ය සමාජය තුළ ජුකී කෙල්ලන් ලෙස මෙම ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් හඳුන්වනු ලබයි. අතලොස්සක් කරනු ලබන්න කටයුතු නිසාවෙන් මෙම සේවිකාවට මෙම ලේබලයේ වැදී ඇත. එම නිසාවෙන් සමාජයේ පිළිගැනීම මෙම සේවිකාවන්ට අහිමි වී ගොස් ඇත. තම රැකියාවෙන් ලැබෙන මුදල් ප්‍රමාණය මදිවීම නිසාවෙන් ඔවුන් සමාජ විරෝධී ක්‍රියාවන්ට පෙළඹෙනු ලබයි. එමෙන්ම අනියම් සබඳතා ආයතන ප්‍රධානිය සමඟ ඇතිකර ගැනීම සිදුකරනු ලබයි. මෙම නිසා මෙම දෝෂාරෝපණ ඇතිවන අතර ගෘහස්ථ ජීවිතයටද ඒ බලපෑම් කරන්නේ තමා වටා සිටින පිරිස ඇඟලුම් කර්මාන්ත සේවිකාවන් වන තමන්ට දක්වන ප්‍රතිචාරය යහපත් නොවන නිසාවෙනි.

"එයා ගාමන්ට් ගිහින් තමයි මේ ගේ හදන්න මූලික අත්තිවාරම දැම්මේ .දැන් මේ තත්වෙට ගේ හදලා තියෙන්නේ ඒ හින්දා එයාට රන්කාසි කීපයකුත් හම්බුනා. කවුරු මොනවා කිච්චත් හරියට වැඩේ කරනවා නම් හරියට වැඩේ කරගන්න පුළුවන් මට දැන් මේ ඒ ලෙවල් වෙනකන් ඉගැන්නුවේ ඔය රස්සාව කරලා තමයි හැබැයි ගොඩක් අය මේ රස්සාවට හොඳ කියන්නෙ නරක විතරයි.මට එක හිතෙන්නෙ ඒක කීප දෙනෙක් හින්ද අනිත් හැමෝටම අහන්න වෙන දෙයක්. "*(ඇඟලුම් කර්මාන්යේ නියුතු කාන්තාවකගේ පියා සමග සාකච්ඡාව -5)*

**බාහිර පුද්ගලයන්ගෙන් එන වේදනාකාරී මතයන් සඳහා මුහුණ දීමට සිදුවීම.**

බාහිර සමාජයෙන් එනු ලබන ඉතා වේදනාකාරී අදහස් ඇතැම් විටෙක මෙම සේවිකාවන්ටබරකි එහිදී ඔවුන් ප්‍රකාශ කරන්නේ තමන්ගේ රැකියාව කෙතරම් යහපත් ලෙස සිදු කරත් සමාජයේ බාහිර පුද්ගලයන්ගෙන් එනු ලබන වේදනාකාරී මතයන් නිසාවෙන් නිරන්තරයෙන් කනස්සල්ලෙන් සිටින බවයි. එම විවිධ මතයන් නිසාවෙන්ද පවුල්වල ආරවුල් වැඩි වෙමින් පවතින බවද එම නිසාවෙන් පවුල්වල පිරිසට පවා වේදනාකාරී අදහස් වලට මුහුණ දීමට සිදුවන බවද ප්‍රකාශ කරන ලදී.

**නිගමන හා නිර්දේශ**

ඇඟලුම් කර්මාන්තයේ සේවිකාවන්ගේ ජීවන තත්ත්වය විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලිව අනාවරණය වන්නේ ෙසේවා ස්ථානයේ පීඩනයක් පැවතීම, ශාරීරික ආබාධ හේතුවෙන් ගෘහස්ථ කාර්යයන් කිරීමට බාධා එල්ලවීම, රැකියාව හේතුවෙන් පවුල් සබඳතාවයන් දුරස්ථ වීම, සමාජයේ ඇති බලපෑම් නිසා පවුල හා රැකියාව අතර ගැටුම් ඇතිවීම මෙන්ම දරුවන්ගේ

සහ පවුලේ කාර්යභාර කළමනාකරණය බරපතලව ඉටු කරමින් ඇඟලුම් කර්මාන්තයේ සේවයට නියුතු කාන්තාවන්ගේ පීඩාකාරී යථාර්ථය වේ.

ඇඟලුම් කර්මාන්තයේ කාන්තා සේවිකාවන් මුහුණ දෙන ගැටලු සලකා බලන මැදිහත්වීම් අතර මනෝවිද්‍යාත්මක උපදේශන සහ මානසික සහය ලබාදීම, රැකියාවේ ආතතිය, පවුල් ගැටලු සහ සමාජ අපකීර්තිය අවම කිරීමට පියවර ගැනීම, නීතිමය තත්ත්වයන් යටතේ සේවා කොන්දේසි හා යහපැවැත්ම වර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනයට සහ පර්යේෂණයට මැදිහත්වීම, කාන්තාවන්ගේ රැකියා තත්ත්වය පිළිබඳ ප්‍රජා දැනුවත් කිරීම, සමාජයේ පවතින සෘණාත්මක ආකල්ප සහ අපකීර්තීන් අවම කිරීම, රැකියාව හා ගෘහස්ථ ජීවිතය සමබර කළමනාකරණය සඳහා මාර්ගෝපදේශ සැපයීම, ඇඟලුම් අංශයේ රැකියා පිළිබඳ සමාජ පිළිගැනීම වැඩිදියුණු කර ඔවුන්ගේ ආර්ථික දායකත්වය ගැන සමාජය දැනුවත් කිරීම, පහළ තනතුරු සඳහා වෘත්තීය සුදුසුකම් හා පැහැදිලි වෘත්තීය ගරුත්වය ඇති වන ලෙස වටපිටාව සකස් කිරීම, රැකියා උසස්වීම් නිසියාකාරව ලබාදීම, සේවා පරිසරය මානව හිතවාදී අයුරින් සංවිධානය කර සේවකයන්ට ධනාත්මක අභිප්‍රේරණයක් ලබාදීම සහ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් වර්ධනය කිරීම, උපකරණ අලුත්වැඩියා හා නිරන්තර අධීක්ෂණය සිදුකර සුදුසු සේවකයන් නිසි අංශයන්ට යොදවා ගැනීම යනාදී වශයෙන් විවිධ මැදිහත්වීම් ක්‍රියාත්මක කළ හැක.

**සාරාංශය**

මෙම අධ්‍යයනයේ මූලික අරමුණු වනුයේ ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු කාන්තාවන්ගේ රැකියා තත්ත්වය මත ගෘහස්ථ ජීවිතයට ඇතිවන බලපෑම හඳුනා ගැනීමය.මෙම පර්යේෂණයේදී සම්මුඛ සාකච්ඡා මෙන්ම සිද්ධි අධ්‍යයනය හරහා අනාවරණය වූ රැකියා තත්ත්වය මත ගෘහස්ථ ජීවිතයට ඇතිවන බලපෑම සාධකයන් සාරාංශගත කර පහත ආකාරයට ගොනුකර දැක්විය හැකිය.දෛනිකව ලබාදෙන වැඩ ප්‍රමාණය අධික වීම පැයකට නිශ්චිත වශයෙන් නිම කිරීමට සිදුවන වැඩ ප්‍රමාණය අධික වීම අධික වෙහෙස වැඩ කරන පරිසරය මානසිකව හිතකර නොවීම විවේකය අවම වීම විනෝදාස්වාදයක් නොමැතිකම දෛනිකව එකම කටයුත්තක නිරත වීම නිසා මනස පීඩාවට පත්වීම.ඉහත හේතුන් නිසාවෙන් සේවිකාවන් වැඩ පරිසරය තුළ ආතතියට පත්වන බව අනාවරණය විය. විශේෂයෙන්ම තම වැඩ පරිසරය තුළ ඔවුන් කටයුතු කරන්නේ කිසිදු කැමැත්තකින් නොවන බවත් වැටුප් ලබා ගැනීමේ අරමුණින් සේවය ලබාදෙන බව ප්‍රකාශ කරන ලදී.සේවා ස්ථානයේදී මෙන්ම තම පවුල සමග කටයුතු කිරීමේදී මෙම සේවිකාවන් මුහුණපාන ගැටලු හා අභියෝග රැසක් ගුණාත්මක අධ්‍යයනය දත්තයන් මගෙන් අනාවරණය විය. ඒවා පහත ආකාරයට සාරාංශ කර දැක්විය හැකිය.දරුවන් රැකබලා ගැනීමේ ගැටලු සැමියාගේ බීමත්කම නිසා මතුවන ගැටලු දරුවන්ගේ අධ්‍යාපනයට සහාය වීමට නොහැකිවීම, සමාජ සම්බන්ධතා බිඳවැටීම, නිවසේ වැඩ කටයුතු අතපසුවීම, දෙමාපියන් රැකබලා ගැනීමට නොහැකිවීම, රෝග සඳහා ප්‍රතිකාර ලබා ගැනීමට නොහැකිවීම, අධික වෙහෙස නිසා නිවසේ කටයුතු සිදුකිරීමට නොහැකිවීම , ආගම දහමෙන් ඈත්වීමට සිදුවීම පවුල තුළ සම්බන්ධතා බිඳ වැටීම මේ ආදී හේතූන් නිසාවෙන්

මෙම සේවිකාවන් තව තවත් මානසිකව පීඩාවට ලක්වේ. විශේෂයෙන්ම මෙම කාන්තාවන් වැඩ පරිසරය තුල හා නිවස තුළදී යන දිවිත්වා කාරයටම පීඩනයට ලක්වන බව අධ්‍යයන දත්තයන් මගින් අනාවරණය විය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Asian Development Bank. (2016). *Women in the workforce: Sri Lanka country report*. Asian Development Bank.

Fernando, L. (2007). *Is work empowering women in Sri Lanka's FTZs?* Law & Society Trust.

Hewamanne, S. (2008). *Stitching identities in a free trade zone: Gender and politics in Sri Lanka*. University of Pennsylvania Press.

International Labour Organization. (2001). *Promoting fair globalization in textiles and clothing in a post-MFA environment*. International Labour Organization.

Jayaweera, S., & Gunetilleke, N. (2002). *The garment industry in Sri Lanka: Prospects and challenges*. Centre for Poverty Analysis.

Kottegoda, S. (2004). *Negotiating household politics: Women's strategies in urban Sri Lanka*. International Centre for Ethnic Studies.

Lynch, C. (2007). *Juki girls, good girls: Gender and cultural politics in Sri Lanka's global garment industry*. Cornell University Press.

Seneviratne, K. (2015). *Challenges faced by women in the apparel sector* [Unpublished report]. University of Colombo, Department of Sociology.

United Nations Population Fund. (2016). *The state of women in Sri Lanka*. UNFPA Sri Lanka.

Women and Media Collective. (2010). *Women workers in the garment industry: A socio-economic analysis*. Women and Media Collective.